# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,921 — 1970 අගෝස්තු 28 වැනි සිකුරාදා — 1970.8.28

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 634 |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... ... | 629 | මිළ පාලන දන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 630 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දන්වීම් ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරණ පත් කිරීම් ආදිය ... | 630 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 632 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — | විවිධ දෙපාර්තමේන්තු දන්වීම් ... ... .. | 644 |
| | | 'සුරාබදු ආඥාපනත'' පිළිබඳ දන්වීම් ... ... | 650 |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය

1970 අංක 246

අංකය: ඩී/වීඑෆ්/42 (iv).

### යුද්ධ හමුදාව—ලංකා ස්වේච්ඡා බලසේනාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පත්කිරීමක් අත්හැර යෑම, විශ්‍රාම ගැනීමක්, උසස් කිරීමක් හා පත්කිරීමක්

(අ) පත්කිරීමක් අත්හැර යෑම

1970 අගෝස්තු මස 16 වැනි දින සිට ලුතිනන්-කර්නල් විල්ප්‍රඩ් හයසින්ත් සවරිමුත්තු, ලං.ජා.ආ.මු., 2 වැනි බල ඇණිය, ලංකා ජාතික ආරක්ෂක මූලවේ අණදෙන නිලධාරි පදවිය අත්හරියි.

(ආ.) විශ්‍රාම ගැනීම

1970 අගෝස්තු මස 16 වැනි දින සිට ලුතිනන්-කර්නල් විල්ප්‍රඩ් හයසින්ත් සවරිමුත්තු, ලං.ජා.ආ.මු., ස්වේච්ඡා බල සේවාවෙන් විශ්‍රාම ගනු ඇත.

(ඇ) උසස් කිරීම

1970 අගෝස්තු මස 16 වැනි දින සිට තාවකාලික ලුතිනන්-කර්නල් වශයෙන්—

මේජර් ඔස්වල්ඩ් චාර්ල්ස් ද අල්විස්, ල.පා.හ.

(ඈ) පත් කිරීම

1970 අගෝස්තු මස 16 වැනි දින සිට 2 වැනි බල ඇණිය, ලංකා ජාතික ආරක්ෂක මූලවේ අණදෙන නිලධාරි වශයෙන් වැඩ බැලීමට, තාවකාලික ලුතිනන්-කර්නල් ඔස්වල්ඩ් චාර්ල්ස් ද අල්විස්, ල.පා.හ. පත්කර ඇත.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඒ. ආර්. රත්නවේල්,
රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 11 දින,
කොළඹ දීය.

8-1036

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන. මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එච්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1970 අංක 247**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත්වීම් නියෝග කර ඇත:—

ඒබී. 75/70

ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ ඒ. ඒ. ද සිල්වා මහතා 1970 අගෝස්තු මස 1 වැනි දින සිට හය මසක කාල සීමාවකට බන්ධනාගාර කොමසාරිස් තනතුරෙහි වැඩ බැලීමට.

ඒ. 22/66

ලංකා පරිපාලන සේවයේ බී. ඒ. විජේවර්ධන මහතා 1970 ජූලි මස 26 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් (ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තිය) තනතුරෙහි වැඩ බැලීමට.

ඒබී. 3/70

නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් ජී. ආර්. කේ. ඩී. එම්. එච්. දෙහෙරගොඩ මහතා 1970 ජූලි මස 16 වැනි දින සිට සොලිසිටර් ජනරාල් වශයෙන්.

ඒ. 10/68

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් එම්. බී. ජේ. සිල්වා මහතා 1970 ජූලි මස 12 වැනි දින සිට නියෝජ්‍ය කොමසාරිස් ලෙස.

ඒ. 37/70

ලංකා පරිපාලන සේවයේ ඈම්. ඈස්. පෙරේරා මහතා 1970 ජූනි මස 24 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, වාරි මාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ අතිරේක ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට.

ඒබී. 49/69

ටී. ඒ. ඩී. අමරසේකර, එම්. ඩබ්ලිව්. පෙරේරා, ජේ. වී. බී. පෙරේරා, සී. තර්මරාජා, ඩී. ජී. සෙනෙවිරත්න සහ එල්. එස්. සැල්ව ඩෝර් යන පොලිස් පරීක්ෂකවරුන් 1970 ජනවාරි මස 1 වැනි දින සිට වැඩබලන සහකාර පොලිස් අධිකාරීන් ලෙස.

ඒබී. 49/69

පොලිස් පරීක්ෂක ජී. ජේ. රත්නනායගම් 1970 පෙබරවාරි මස 15 වැනි දින සිට වැඩබලන සහකාර පොලිස් අධිකාරි ලෙස.

ඒබී. 70/69

වැඩබලන රජයේ අධිනීතිඥ, ටී. එල්. බී. ප්‍රනාන්දු මහතා 1969 ඔක්තෝබර් මස 16 වැනි දින සිට රජයේ අධිනීතිඥවරයෙකු වශයෙන්.

එස්. පී. නානායක්කාර,
ලේකම්.
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංක 500,
කොළඹ 1, 1970 අගෝස්තු මස 21 වැනි දින,

8-1020

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය

**1970 අංක 248**

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේය:—

අංකය: ජේඑම්/ජී. 47/66.

ඩී. විමලරත්න මහතා 1970 අගෝස්තු මස 13 වැනි දින සිට 21 වැනි දින දක්වා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් ධුරය ස්ථිර වශයෙන් උසුලන අය නිවාඩු පිට සිටින අතර එහි වැඩ බැලීමට.

අංකය: ජේඑම්/ජී. 40/66.

ආර්. ඩී. බී. ජයසේකර මහතා 1970 අගෝස්තු මස 14 වන දින සිට 26 වන දින දක්වා කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ කුරුණෑගල අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය: ජේඑල්/එෆ්. 3/65.

එෆ්. ජී. බී. ප්‍රනාන්දු මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. එම්. මුස්තපා මහතා 1970 අගෝස්තු මස 15 දින සිට 17 දින දක්වා මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ දුම්බර අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන වශයෙන්.

අංකය: ජේඑල්/එස්. 31/65.

ඩී. එස්. ඩී. පී. ආර්. සේනානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එච්. එස්. ඒ. පෙරේරා මහතා 1970 අගෝස්තු මස 8 දින සිට 10 දින දක්වා කුලියාපිටියේ පළාත් ආණ්ඩු සභා සීමාව තුළ කනදුල්ලේ පිහිටි උසාවියේ ක්‍රියාකරන කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය: ජේඑල්/පී/9/67.

එල්. එස්. පෙරේරා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එෆ්. ආර්. වීරසේකර මහතා 1970 අගෝස්තු මස 7 වැනි දින සහ 10 වැනි දින සිට 13 වැනි දින දක්වා රත්නපුර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය: ජේඑල්/එස්. 35/67.

එච්. ඩබ්ලිව්. සේනානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු පී. එස්. බුල් මහතා 1970 අගෝස්තු මස 11 වැනි දින හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය: ජේඑල්/ජී. 13/64.

එස්. බී. ගුණවර්ධන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. එස්. රාජපක්ෂ මහතා 1970 අගෝස්තු මස 5 වැනි දින හලාවත සහ පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය: ජේඑල්/ඩී. 24/62.

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. කනගරත්නම් මහතා 1970 අගෝස්තු මස 7 වැනි දින සිට 10 වැනි දින දක්වා යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, කයිට්ස්හි අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන වශයෙන්.

අංකය: ජේඑල්/ඩබ්ලිව්. 13/67.

ඩබ්ලිව්. එන්. එස්. විජේරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු එම්. ඕ. එම්. තහීර් මහතා 1970 අගෝස්තු මස 10 වැනි දින කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය: ජේඑල්/ඩී. 18/56.

එල්. එච්. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ටී. ඊස්. පී. ද එස්. ගුණසේකර මහතා 1970 අගෝස්තු මස 10 සහ 11 දිනයන්හි බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය: ජේඑල්/ඩී. 28/65.

ජී. ජී. ඩී. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඩබ්ලිව්. ජේ. ෆොන්සේකා මහතා 1970 අගෝස්තු මස 7 වැනි දින පානදුර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය ජේඑල්/ඩබ්ලිව්. 14/67.

ඩබ්ලිව්. ජී. එන්. වීරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. ආර්. බී. ඒ. ගුණතිලක මහතා 1970 අගෝස්තු මස 4 වැනි දින කළුතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/බී. 22/59.

ඊ. ඩී. ජී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු කේ. වී. නඩරාජා මහතා 1970 අගෝස්තු මස 4 වැනි දින සිට 8 දින දක්වා බදුල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/එස්. 25/62.

ජේ. බී. සී. ස්වාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු සී. එම්. එල්. ද සිල්වා මහතා 1970 අගෝස්තු මස 11 වැනි දින සිට නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ බදුල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/පී. 7/67.

කේ. පාලකිඩ්නර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. එම්. අබුතාහිර් මහතා 1970 අගෝස්තු මස 13 දින සිට 16 දින දක්වා පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : ජේඑල්/ආර්. 12/67.

පී. බී. රඹුක්වැල්ල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ඩී. සී. ඊ. වී. කරුණාරත්න මහතා 1970 අගෝස්තු මස 12 වැනි දින සහ 15 වැනි දින සිට 20 දින දක්වා මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේජේ. 50/54.

කේ. රත්නසිංහම් මහතා 1970 අගෝස්තු මස 20 වන දින සිට පේදුරුතුඩුවේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 2697 දරණ නඩුවේ මහෙස්ත්‍රාත් තැනගේ සාක්ෂි සටහන් කර ගැනීම පිණිස පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/සී. 16/53.

සිසිල් ඊ. පෙරේරා මහතා 1970 අගෝස්තු මස 14 දින සිට 17 දින දක්වා කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/සී. 16/53.

එච්. ඊ. විජේතුංග මහතා 1970 අගෝස්තු මස 18 දින සිට 21 දින දක්වා කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/සී. 16/53.

වෝල්ටර් සී. පෙරේරා මහතා 1970 අගෝස්තු මස 22 දින සිට 26 දින දක්වා කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : ජේඑල්/සී. 27/64.

එම්. බී. ජී. දිසානායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ඒ. සිමම්පිල්ලේ මහතා 1970 අගෝස්තු මස 12 වැනි දින මන්නාරමේ සහ වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන්.

අංකය : පීඑල්/එන්. 2/57.

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ඒ. සීමන්පිල්ලේ මහතා 1970 අගෝස්තු මස 9 වැනි දින සිට 11 වැනි දින දක්වා මන්නාරමේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/එස්. 17/68.

ඒ. එම්. අයි. සහිඩ් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු පී. වී. සේනාධිරාජා මහතා 1970 අගෝස්තු මස 9 වැනි දින සිට 11 වැනි දින දක්වා වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, ළමා මහෙස්ත්‍රාත් තැන. අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන්.

අංකය : පීඑල්/එස්. 17/68.

ඒ. එම්. අයි. සහිඩ් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු පී. වී. සේනාධිරාජා මහතා 1970 අගෝස්තු මස 11 වැනි දින වවුනියාව සහ යාපනය දිස්ත්‍රික්කයන්හි වවුනියාවේ උතුර සහ මුහුදුබඩ පත්තු ගම්බද උසාවි සභාපති සහ පූනාකාරි තුන්නුකායි අතිරේක ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/යූ. 2/48.

ජේ. ඩබ්ලිව්. බී. උඳලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ඩී. ජයසිංහ මහතා 1970 අගෝස්තු මස 19, 21 සහ 24 දිනයන්හි කෑගල්ල දිස්ත්‍රික්කයේ ගල්බොඩ කිනිකොඩ බෙලිගල් සහ පරණකුරු කෝරළයන්හි ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්. 2/57.

කේ. වී. නවරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු ඒ. සිමම්පිල්ලේ මහතා 1970 අගෝස්තු මස 11 වැනි දින මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්නාරමේ ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/එන්. 3/59.

ජී. නුගවෙල මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු එල්. බී. කරල්ලියද්ද මහතා 1970 අගෝස්තු මස 12 වැනි දින මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර සහ උඩ දුම්බර ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ජේ. 6/63.

කේ. ජී. ජයසේන මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. ඒ. යටවර මහතා 1970 අගෝස්තු මස 25, 26, 27, 28, 29, 30 සහ සැප්තැම්බර් 1, 2, 3, 4, 5, 6, 7 සහ 9 වැනි දින යන්හි මහනුවර දිස්ත්‍රික්කයේ මාතලේ දකුණ සහ නැගෙනහිර ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 10/61.

එච්. අමීන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු කේ. ඒ. අරසකෝන් මහතා 1970 අගෝස්තු මස 12, 13, 14 සහ 15 වැනි දිනයන්හි මඩකලපුව දිස්ත්‍රික්කයේ එරවූර් කෝරළේ බින්තැන්න පත්තු සහ උතුරු මාම්මූනෙයි පත්තුව ගම්බද උසාවි සභාපති වශයෙන් වැඩ බැලීමට.

අංකය : කිව්ඒඒ/එස්. 1/70.

එම්. ඒ. කාදර් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් උතුරු කොළඹ කාති උසාවියේ අංක 5909/M දරණ නඩුව අසා නිම කර තීන්දුව දීම පිණිස උතුරු කොළඹ කාති උසාවියේ විශේෂ කාති වශයෙන්.

සිරිමෙවන් අමරසිංහ,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1970 අගෝස්තු මස 21 දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

8-1023

## වෙනත් පත්කිරීම් ආදිය

**1970 අංක 249**

පා 4/සාවි/නිල 12., පා 4/සාවි/නිල 28.,
පා 4/සාවි/නිල 29., පා 4/සාවි/නිල 32.,
පා 4/සාවි/33/20.,

**අධිකරණ අමාත්‍යාංශය**

**82 වන වගන්තිය යටතේ දැන්වීම**

(6 වන අධිකාරය වූ) අධිකරණ ආඥාපනතෙහි 82 වන වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, අධිකරණ ඇමති, ජුසේ මරියා ජයමාන්න වන මම,

(1) එස්. එච්. එස්. ගුණරත්න මහතා, ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් ධුරය දරණ කාලය තුළ ගම්පහ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චය විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(2) එච්. ඕ. කේ. වීරමන් මහතා, ගාල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් ධුරය දරණ කාලය තුළ ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චය කරුවෙකු වශයෙන් ද,

(3) වී. සින්නදුරෙයි මහතා, ත්‍රිකුණාමලය ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් ධුරය දරණ කාලය තුළ ත්‍රිකුණාමලය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(4) ජී. ඒ. පී. පෙරේරා මහතා, මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් ධුරය දරණ කාලය තුළ මීගමුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චය කරුවෙකු වශයෙන් ද,

(5) සී. එච්. ගුණවර්ධන මහතා, මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් ධුරය දරණ කාලය තුළ මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චය කරුවෙකු වශයෙන් ද,

(6) ඩබ්ලිව්. එම්. කේ. බී. වීරසේකර මහතා, මාතලේ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් ධුරය දරණ කාලය තුළ මාතලේ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(7) ඩබ්ලිව්. ඕ. එච්. ඉන්දරත්න මහතා, අනුරාධපුරය ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් ධුරය දරණ කාලය තුළ අනුරාධපුරය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(8) වී. ඤානගුරු මහතා, මන්නාරම ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් ධුරය දරණ කාලය තුළ මන්නාරම අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(9) ඩබ්ලිව්. එම්. ජේ. වීරසූරිය මහතා, හලාවත ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් ධුරය දරණ කාලය තුළ හලාවත අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චය කරුවෙකු වශයෙන් ද,

(10) එල්. පියසේන මහතා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් ධුරය දරණ කාලය තුළ සියළුම අධිකරණ දිස්ත්‍රික්කයන් සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(11) ඕ. ට්. ප්‍රනාන්දු මහතා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ධුරය දරණ කාලය තුළ සියළුම අධිකරණ දිස්ත්‍රික්කයන් සඳහා සාමදාන විනිශ්චය කරුවෙකු වශයෙන් ද,

(12) සී. සිවප්‍රකාශම් මහතා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ධුරය දරණ කාලය තුළ සියළුම අධිකරණ දිස්ත්‍රික්කයන් සඳහා සාමදාන විනිශ්චය කරුවෙකු වශයෙන් ද,

(13) කේ. එස්. පරාක්‍රම මහතා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ධුරය දරණ කාලය තුළ සියළුම අධිකරණ දිස්ත්‍රික්කයන් සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(14) නාගලිංගම් තංගරාජා මහතා, රාජකීය ලංකා නාවික හමුදාවේ සිවිල් පාලක නිලධාරි හා ගණකාධිකාරි ධුරය දරණ කාලය තුළ කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(15) ලීල් ගුණසේකර මහතා, කැබිනට් මණ්ඩලයේ ලේකම් ධුරය දරණ කාලය තුළ කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

(16) මද්දුම පතිරන්නැහැලාගේ දාවිත් සිංඤෝ මහතා, පොලොන්නරුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු වශයෙන් ද,

පත් කරමි.

ජේ. ඇම්. ජයමාන්න,
අධිකරණ ඇමති.

1970 අගෝස්තු මස 20 වැනිදා,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

8-960

---

**1970 අංක 250**

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

උපාලි ලේනව මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970ක්වූ අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

8-804

---

**1970 අංක 251**

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ලක්ෂ්මන් සුනිල් ප්‍රේම් ජයතිලක මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන්ගෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

8-807

---

**1970 අංක 252**

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ඔබ්වේගලගේ සෝමදාස පෙරේරා මහතා කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

8-802

---

**1970 අංක 253**

### නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

මාලනී සබාරත්නම් මෙනෙවිය, කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන්, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

8-971

1970 අංක 254

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

සේන එදිරිවීර විජේසූරිය මහතා, කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

8-978

---

1970 අංක 255

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ජානක එරික් ගුණසේකර මහතා, කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දීය.
8-984

---

1970 අංක 256

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ඩයස් සමරකෝන් මහතා, කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

8-980

---

1970 අංක 256

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

නෙවිල් නාලින් පෙරේරා අමරසිංහ මහතා, කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

8-985

---

1970 අංක 258

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

නෙවිල් හෙන්රි ප්‍රනාන්දු මහතා, පානදුර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

8-808

---

1970 අංක 259

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

මයිකල් ඉරසිංහ මහතා, පානදුර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

8-979

---

1970 අංක 260

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

සිසිර පද්මා ජයවර්ධන මහත්මිය, මීගමුව අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි සහ සිංහල භාෂාවන්ගෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

8-806

---

1970 අංක 261

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

අබ්දුල් මජීඩ් මොහමඩ් හම්සා මහතා, කළුතර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

8-982

---

1970 අංක 262

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ජෝන් එව්ලින් ඉලන්ගන්තිලක මහතා, මහනුවර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

8-813

---

1970 අංක 263

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ගාර්දියෙ හේවාවසන් ගාල්ලගේ ලයනල් අසෝක ද සිල්වා මහතා ගාල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලනය, පළාත් පාලන සහ සවදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970ක්වූ අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

8-801

### 1970 අංක 264

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ජෝසිස් ඇනෙල් විජේසිංහ මෙනෙවිය, ගාල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

8-809

### 1970 අංක 265

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

අල්වාපිල්ලේ තඩරාජසුන්දරම් රාමචන්ද්‍රන් මහතා, පේදුරුතුඩුව අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970ක්වූ අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

8-803

### 1970 අංක 266

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

උද්මා ලෙබ්බෙ මොහමඩ් මොහිදීන් මහතා, මඩකලපුව අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

8-983

### 1970 අංක 267

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

හේරත් පතිරන්නැහැලාගේ පුංචිබණ්ඩා මහතා, මාකඳුරේ වාසස්ථානය සහ කාර්යාලය ද කඳානේගෙදර අතුරු කාර්යාලය ඇතුව කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

8-986

### 1970 අංක 268

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

කච්චකඩුගේ ගොඩ්ෆ්‍රේ ජෝෂප් ප්‍රනාන්දු මහතා, හලාවත අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

8-805

### 1970 අංක 269

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ඉන්දිරා ප්‍රියදර්ශනී ආසිර්වාදම් මෙනවිය, රත්නපුර අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

8-981

### 1970 අංක 270

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

ඩෙන්සිල් මර්වින් ලූවී ප්‍රනාන්දු මහතා, කෑගල්ල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් පත් කර තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

8-987

# ආණ්ඩුවේ නිවේදන

## මුද්දර ආඥාපනත

(247 වැනි අධිකාරය වන) මුද්දර ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ මුදල් ඇමති විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාවයි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

1970 අගෝස්තු 21 දින,
කොළඹ දීය.

### ව්‍යවස්ථාව

(247 වැනි අධිකාරය වන) මුද්දර ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ පනවා 1966 අගෝස්තු 5 වැනි දින අංක 14,707 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ, 1970 අගෝස්තු 14 වැනි දින 14,919 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධිත ව්‍යවස්ථාව, ඊට යාකොට ඇති උපලේඛනයෙහි 80 වැනි විෂයට ඉක්බිතිව පහත සඳහන් අලුත් විෂය ඇතුලත් කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"81. දිවංගත අගමැති ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ පිළිරුවක් පිළිබිඹු කෙරෙන ශත 10 වටිනාකමින් යුක්තවූ තැපැල් හා ආදායම් මුද්දර."

8-1025

## තැපැල් කාර්යාලයීය ආඥාපනත

(190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාලීය ආඥාපනතේ 16 වැනි වගන්තිය යටතේ තැපැල් සහ විදුලි සංදේශ ඇමතිවරයා විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාවයි.

සී. කුමාරසූරියර්,
තැපැල් සහ විදුලි සංදේශ ඇමති.

1970.8.19 දින,
කොළඹ දී ය.

### ව්‍යවස්ථාව

(190 වැනි අධිකාරය වන) තැපැල් කාර්යාලීය ආඥා පනතේ 16 වැනි වගන්තිය යටතේ පනවා 1966 අගෝස්තු 5 වැනි දින අංක 14,707 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1970 අගෝස්තු 14 වැනි දින 14,919 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථාවෙන් අන්තිම වරට සංශෝධිත ව්‍යවස්ථාව, ඊට යා කොට ඇති

උප ලේඛනයෙහි 81 වැනි විෂයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් විෂය ඇතුලත් කිරීමෙන් තව දුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"82. දිවංගත අගමැති, ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතාගේ පිළිරුවක් පිළිබිඹු කෙරෙන ශත 10 වටිනාකමින් යුක්ත වූ තැපැල් හා ආදායම් මුද්දර".

8-954

---

## නිවේදනය

ගරු කම්කරු ඇමතිතුමා විසින් 132 වැනි පරිච්ඡේදය වන ඉන්දියානු ආගාමික කම්කරු ආඥාපනතේ 9 (1) වන වගන්තිය යටතේ පහත සඳහන් මහතුන්, 1970 අගෝස්තු 1 වන දින සිට 1972 දෙසැම්බර් 31 දක්වා කාලසීමාවට ඉන්දියානු ආගාමික කම්කරු මණ්ඩලයේ සාමාජිකයින් වශයෙන් සේවය කිරීම සඳහා පත්කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ :—

1. පාර්ලිමේන්තු මන්ත්‍රී ජේ. ඩී. වීරසේකර මහතා.
2. පාර්ලිමේන්තු මන්ත්‍රී පියසේන තෙන්නකෝන් මහතා.
3. පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ. අසීස් මහතා.
4. වී. පී. ගනේසන් මහතා.
5. ටී. ආර්. ආර්. විජේවික්‍රම මහතා.
6. ඒ. එම්. එස්. පෙරේරා මහතා.
7. කේ. ජේ. රත්වත්ත මහතා.

වැඩ බලන ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ 5,
කම්කරු අමාත්‍යාංශයේදිය.

8-853

---

ඇල්.ඩී.බී. 12/68.

## 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත

### 2 (1) වගන්තිය යටතේ නියෝගය

1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතෙහි 2 (1) වගන්තියෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර, නැව් කටයුතු හා සංචාරක කටයුතු ඇමති, ඉඩම්පිටියෙ රාල්ලාගේ පුංචි බණ්ඩා ගුණතිලක කළුගල්ල වන මම, 1966 අංක 10 දරන පනතින් පිහිටුවන ලද රජයේ සංස්ථාවක් වන ලංකා සංචාරක මණ්ඩලයේ සංචාරක සංවර්ධන යෝජනා ක්‍රමයක කාර්යය උදෙසා පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් ඉඩම අත්කර ගැනීම මෙම ආඥාව මගින් අනුමත කරමි.

පී. බී. ජී. කළුගල්ල,
නැව් කටයුතු හා සංචාරක කටයුතු ඇමති.

1970 අගෝස්තු 12 දින,
කොළඹ.

## උපලේඛනය

1. දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කයේ බෙන්තොට වලල්ලාවිටි කෝරළයේ බටහිර අංගාගොඩ ග්‍රාම සේවක කොට්ඨාශයෙහි පිහිටි—

උතුරට : නාදුවත්ත යැයි හැඳින්වෙන ඒකාබද්ධ ඉඩම ;
නැගෙනහිරට : එම ඉඩමෙන්ම කොටසක් ;
දකුණට : එම ඉඩමෙන්ම කොටසක් ;
බටහිරට : එම ඉඩමෙන්ම කොටසක්, මායිම් වන ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 7 ක් පමණ වූ, පතිරගේ වත්ත යැයි හැඳින්වෙන බිම් කැබැල්ල.

2. ඉහත කී බෙන්තොට වලල්ලාවිටි කෝරළේ බටහිර අංගාගොඩ ග්‍රාමසේවක කොට්ඨාශයෙහි—

උතුරට : සරණංකර පාර ;
නැගෙනහිරට : එම ඉඩමෙන්ම කොටසක් ;
දකුණට : පතිරගේ වත්ත යැයි හැඳින්වෙන ඒකාබද්ධ ඉඩම ;
බටහිරට : එම ඉඩමෙන්ම කොටසක්, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 8 ක් පමණ වූ, නාදුවත්ත යැයි හැඳින්වෙන බිම් කොටස.

8-815

---

ඇල්.ඩී.—බී 207/41.

## පඩි පාලක සභා ආඥාපනත

### 8 වැනි වගන්තිය යටතේ ආඥාව

කම්කරු ඇමති, මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 8 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී ආඥාපනතේ 6 වැනි වගන්තිය යටතේ සම්පදම් කිරීමේ, පාවහන් හා සම්භාණ්ඩ සෑදීමේ කර්මාන්තයට අදාලව පනවනු ලැබ 1970 අප්‍රේල් 26 වන දින හා අංක 14,903/3 දරන ගැසට් පත්‍රයෙහි පල කරන ලද ආඥාවෙහි වඩා සවිස්තරව දක්වා ඇති ඒ කර්මාන්තය සඳහා පඩිපාලක සභාවක් මේ ආඥාවෙන් පිහිටුවමි.

ඇම්. පී. ද ඉසැඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1970 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දීය.

8-962

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4 (3) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි බින්තැන්න ගම් ප්‍රදේශයේ සමගිදායකයින් ගේ සභාවේ සභාපති ව සිට එම ධුරයෙන් ඉවත් කරන ලද මාපාකඩ වැව පදිංචි විජේතුංග මුදියන්සේලාගේ ජයවර්ධන බණ්ඩා මහතා වෙනුවට, මහියංගනය පදිංචි බලගල්ලේ රාජපක්ෂ මුදියන්සේලාගේ විජේකෝන් මහතා එකී සභාවේ සාමාජික ධුරය දරණ කාලය තුළ දී එම සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදිය.

8-882/1

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4 (3) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, බදුල්ල දිස්ත්‍රික්කයේ බින්තැන්න ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගිදායක සභාවේ සභාපති මාපාකඩවැව, පදිංචි විජේතුංග මුදියන්සේලාගේ ජයවර්ධන බණ්ඩා මහතා නිලයෙන් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදිය.

8-882/2

---

## සමගි මණ්ඩල පනත

### 3 (2) වන වගන්තිය යටතේ වූ දැන්වීම

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ, 1970 ජූනි 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, මීට යකොට ඇති උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් එක් එක් ප්‍රදේශය සඳහා සමගිදායකයින්ගේ මණ්ඩලයක් සංස්ථාපනය කිරීමට අදහස් කරන බවත්, ඒ එක් එක් ප්‍රදේශයෙහි සමගිදායකයින් ගේ මණ්ඩලයට පත් කළ යුතු තැනැත්තන් සම්බන්ධයෙන් ඒ වගන්තියේ (3) උප වගන්තිය යටතේ නිර්දේශයන් ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැන ගේ කාර්යාලයේ ඇති ආකෘතිපත්‍රය මගින් 1970 සැප්තැම්බර් 30 වන දින හෝ ඊට පෙර මා වෙත ඉදිරිපත් කළ හැකි බවත් මෙයින් දැනුම් දෙමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

## උපලේඛනය

1. කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි උඩුගහපත්තු ගම් ප්‍රදේශය,
2. කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි දළුගම සුළුනගර සහා ප්‍රදේශය.
3. කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි කැළණිය සුළු නගර සභා ප්‍රදේශය,
4. කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි උඩුගම්පොල ගම් ප්‍රදේශය,
5. කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි මිනුවන්ගොඩ සුළු නගර සභා ප්‍රදේශය,
6. කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි ගලහිටියාව ගම් ප්‍රදේශය,
7. කොළඹ දිස්ත්‍රික්කය තුළ පිහිටි මොරටුව පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය,
8. ගාලු දිස්ත්‍රික්කය තුළ පිහිටි අහංගම සුළු නගර සභා ප්‍රදේශය,
9. අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි කිරලව් කෝරලේ නැගෙනහිර ගම් ප්‍රදේශය,
10. මාතලේ දිස්ත්‍රික්කය තුළ පිහිටි උඩුගොඩ උඩසියපත්තු නැගෙනහිර ගම් ප්‍රදේශය,
11. පුත්තලම හා හලාවත දිස්ත්‍රික්කය තුළ පිහිටි ආඩිගම ගම් ප්‍රදේශය,
12. පුත්තලම හා හලාවත දිස්ත්‍රික්කය තුළ පිහිටි කම්මල්පත්තු ගම් ප්‍රදේශය,
13. බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි කන්දපල්ල අංක 1 ගම් ප්‍රදේශය,
14. බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි හපුතලේගම ගම් ප්‍රදේශය.
15. බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටි නිකපොත ගම් ප්‍රදේශය.
16. රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි හිලිඩිලේ ගම් ප්‍රදේශය,
17. රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි කුරුවිට ගම් ප්‍රදේශය,
18. මොණරාගල දිස්ත්‍රික්කය තුළ පිහිටි වැල්ලවාය ප්‍රදේශය,
19. නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ පිහිටි කොහොක ගම් ප්‍රදේශය.

8-881

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4 (3) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුරුතැන්ගේ ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගි දායක සභාවේ සභාපති, නක්කාවත්ත, වික්කුණුවල පදිංචි පතිරාජ මුදියන්සේලාගේ සුමදරත්න මහතා තිලයෙන් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-883/1

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටි මුරුතැන්ගේ ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති වශයෙන් සිට එම ධුරයෙන් ඉවත් කරන ලද, නක්කාවත්ත, වික්කුණුවල පදිංචි පතිරාජ මුදියන්සේලාගේ සුමදරත්න මහතා වෙනුවට, හොරෙම්බාව කොවුල් වැව, බටහිරවත්ත පදිංචි දොන් පවුලිස් ජයසේකර මහතා එකී සභාවේ සාමාජික ධුරය දරණ කාලය තුළදී එම සභාවෙහි සභාපති වශයෙන් මෙසින් පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-883/2

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාවේ 47 (2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1970 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, හලාවත දිස්ත්‍රික්කය තුළ පිහිටි කම්මල්පත්තු ගම් ප්‍රදේශයේ සමගිදායකයින්ගේ සභාවේ සභාපති ව සිට එම ධුරයෙන් ඉල්ලා අස් වූ වෙන්නප්පුව, බස්නාහිර දුම්මලදෙනිය පදිංචි බෙනිස් මිල්ටන් හියුබට් රණවීර මහතා වෙනුවට වෙන්නප්පුව, බටහිර දුම්මලදෙනිය පදිංචි පත්තිනි කුට්ටිගේ ඇන්තනි නෝනිස් මහතා එකී සභාවේ සාමාජික ධුරය දරණ කාලය තුළ දී එම සභාවේ සභාපති වශයෙන් මෙසින් පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 අගෝස්තු මස 17 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-883/3

---

## සමගි මණ්ඩල පනත

1959 අංක 4 දරණ පනතින් සංශෝධිත 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජ සභා ආඥාවේ 47(2) වන වගන්තිය යටතේ පනවනු ලැබ 1 70 ජූනි මස 16 වන දින අංක 14,910/8 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නිවේදනය සමග කියවිය යුතු 1963 අංක 12 දරණ පනතින් සංශෝධිත 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතේ 3 (7) සහ 4 3) වන වගන්ති වලින් මා වෙත පැවරී ඇති බලතල පාවිච්චි කරමින්, අධිකරණ ඇමතිවරයාගේ පාර්ලිමේන්තු ලේකම්, රත්නසිරි වික්‍රමනායක වන මම, කෑගල්ල දිස්ත්‍රික්කයේ උඩුව පළාත් ගම් ප්‍රදේශය සඳහා සංස්ථාපනය කරනු ලැබූ සමගිදායක සභාවේ සාමාජිකයින් සියළු දෙනා සහ සභාපති ද එකී තනතුරු වලින් ඉවත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
අධිකරණ ඇමතිවරයාගේ
පාර්ලිමේන්තු ලේකම්.

1970 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

8-968

---

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

පේදුරුතුඩුව සහ චාවකච්චේරිය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් සිව්සංගාරම් බාලේන්ද්‍රන් මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත දෙමළ භාෂාවෙන්ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් අවසර දී තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

8-812

---

## නොතාරිස් ආඥාපනත (107 වන අධිකාරය)

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් මේරි රූත් ඉන්ද්‍රානි විජේසී හා මෙනවියට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන්ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන හා පළාත් පාලන සහ සවදේශ කටයුතු පිළිබඳ ගරු ඇමති තුමා විසින් අවසර දී තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

8-814

## නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

බලපිටිය අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් රුවන් පුර අමරනාත ද සිල්වා මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 ක්වූ අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

8-810

## නොතාරිස් ආඥපනත (107 වන අධිකාරය)

කොළඹ අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් රන්ජන් අබේසේකර මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ද නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් අවසර දී තිබේ.

බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දීය.

8-811

---

ඇල්.ඩී.—බී. 64/48

## පඩිපාලක සභා ආඥපනත

### නිවේදනයයි

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥපනතේ 30 වැනි වගන්තියෙන් මුද්‍රණ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මීට යාව ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් ඒ උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට, මුද්‍රණ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව අදහස් කරන බව එකී ආඥපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒ සභාව විසින් මෙයින් නිවේදනය කරණු ලැබේ.

ඉහත කී යෝජනාවට ඉදිරිපත් කරනු ලබන විරුද්ධතා 1970 සැප්තැම්බර් මස 12 වැනි දින දවල් 12 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාර ගනු ලැබේ.

ඉදිරිපත් කරන ඒ සෑම විරුද්ධතාවක් ම එසේ විරුද්ධවීමට හේතු වූ කරුණු පිළබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතු ය.

ඩබ්. එල්. පී. ද මැල්,
මුද්‍රණ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සභාපති.

1970 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

## උපලේඛනය

අවම වේතන සම්බන්ධයෙන් මුද්‍රණ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1945 ජූලි 21 වැනි දින අංක 9,436 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරනු ලැබූ ද තීරණ, එම උපලේඛනයේ 11 වන කොටස වෙනුවට පහත සඳහන් අළුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය :—

### 11 වන කොටස

(1) මුද්‍රණ කර්මාන්තයේ වේතන මාසික ක්‍රමයට ගෙවිය යුතු වේ.

(2) කාල මිම්මේ වැඩවලට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය මෙහි පහත දක්වෙන පරිදි වූ මූලික වේතනයකින් හා විශේෂ දීමනාවකින් යුක්ත විය යුතු ය.

(3) (අ) මෙම කොටසෙහි සඳහන් කවර පංතියක හෝ කම්කරුවෙකු මෙහි පහත 1 වන තීරයෙහි සඳහන් යම්කිසි මාසයක එම මාසය වෙනුවෙන් මෙහි පහත 2 වන තීරයෙහි නියමිත වැඩ කළ යුතු අඩු ම දින ගණන තුළ වැඩ කර තිබේ නම් ඒ කම්කරුවා අයත් පංතිය වෙනුවෙන් මෙම කොටසෙහි නියමිත අඩු ම මාසික වේතන ප්‍රමාණයට සමාන මුදලක් ඒ මාසයේ වේතනය වශයෙන් ඔහුට ගෙවිය යුතු ය :

එසේ වුව ද, පූර්වෝක්ත 2 වන තීරයෙහි නියමිත වැඩ කළ යුතු අඩු ම දින ගණන, ඉරුදින පහත් ඇති කවර මාසයක් සම්බන්ධයෙන් වුව ද එක් දවසකින් අඩු විය යුත්තේය.

මේ අනුච්ඡේදයේ කාර්ය සඳහා, වැඩට අවුත් පෙනී සිටින යම්කිසි කම්කරුවෙකුට වැඩ දීමට සේව්‍යයාට නොහැකි වන කවර දවසක් වුවත් ඒ කම්කරුවා වැඩ කළ දවසක් සේ ගිණිය යුතු ය.

| 1<br>මාසය | | | | 2<br>වැඩ කළ යුතු අඩුම දින ගණන |
|---|---|---|---|---|
| ජනවාරි | ... | ... | ... | 27 |
| පෙබරවාරි | ... | ... | ... | 24 |
| මාර්තු | ... | ... | ... | 27 |
| අප්‍රේල් | ... | ... | ... | 26 |
| මැයි | ... | ... | ... | 27 |
| ජූනි | ... | ... | ... | 26 |
| ජූලි | ... | ... | ... | 27 |
| අගෝස්තු | ... | ... | ... | 27 |
| සැප්තැම්බර් | ... | ... | ... | 26 |
| ඔක්තෝබර් | ... | ... | ... | 27 |
| නොවැම්බර් | ... | ... | ... | 26 |
| දෙසැම්බර් | ... | ... | ... | 27 |

(ආ) මේ ඡේදයේ (අ) අනුච්ඡේදයේ සඳහන් කවර මාසයක හෝ එම මාසයට නියමිත වැඩ කළයුතු අඩුම දින ගණනට වැඩිපුර වැඩ කරන එක් එක් දවසකට ගෙවිය යුතු අඩුම වේතන ප්‍රමාණය විය යුත්තේ අඩුම මාසික වේතන ප්‍රමාණය 25න් බෙදීමෙන් දවසකට වැටෙන අඩුම වේතනය මෙන් දෙගුණයකට සමාන මුදලකි.

(4) යම් කම්කරුවෙකු සම්පූර්ණ මාසයක් රක්ෂාව කර නැති විට ඔහුට වේතන වශයෙන් ගෙවිය යුතු මුදල වන්නේ ඔහු රක්ෂාව කළ කාලයත්, ඒ මාසයේ ඇති දින ගණනත් අතර ඇති අනුපාතය, අවම මාසික වේතනයට සමානුපාත වනසේ ගණන් බැලූ මුදල් ප්‍රමාණයකි.

(5). අවසර නොලබා වැඩට නොපැමිණීම නිසා මෙම කොටසෙහි සඳහන් කවර පන්තියකට හෝ අයත් කම්කරුවෙකු විසින් යම් මාසයක දී (3) (අ) වන ඡේදයේ නියමිත වැඩ කළ යුතු අඩුම දින ගණන තුළ වැඩ කර නොමැති විට, එම මාසයේ වැඩ කළයුතු අඩුම දින ගණන හා අවසර නොලබා වැඩට නොපැමිණි දින ගණන හා අතර වෙනස වැඩ කළ යුතු අඩුම දින ගණනට අනුපාත වන ප්‍රමාණය, මෙම කොටසෙහි ඒ කම්කරුවාගේ පංතියට නියමිත අඩුම මාසික වේතන ප්‍රමාණයට සමානුපාත වන්නේ යම් ප්‍රමාණයකට ද ඒ ප්‍රමාණයේ මුදලක් ඔහුට ඒ මාසයේ වේතන වශයෙන් ගෙවිය යුතු ය.

(6) නිවාඩු දවස්වල හෝ කම්කරුවෙකුට සම්පූර්ණ පඩි සහිත නිවාඩු දී තිබෙන දවස්වල හෝ වැඩට නොපැමිණීම, අවසර නොලබා වැඩට නොපැමිණීමක් ලෙස නොසැලකිය යුතු ය.

| 1 කම්කරුවාගේ පන්තිය | 2 මාසයකට මූලික වේතන ප්‍රමාණය | | | | | | (ආ) ගතවූ මාසයේ ජීවන වියදම් අංකය 100·1 නම් විශේෂ දීමනාව වන්නේ | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩ ඉගෙන ගන්නන් හා වැඩ පුරුදු වන්නන් නොවූ කම්කරුවන්ට | වැඩ ඉගෙන ගන්නෝ සහ වැඩ පුහුණුවන්නෝ | | | | | වැඩ ඉගෙන ගන්නන් හා වැඩ පුරුදු වන්නන් නොවූ කම්කරුවන්ට | වැඩ ඉගෙන ගන්නෝ සහ වැඩ පුහුණුවන්නෝ | | | | |
| | | 1 වන අවුරුද්ද | 2 වන අවුරුද්ද | 3 වන අවුරුද්ද | 4 වන අවුරුද්ද | 5 වන අවුරුද්ද | | 1 වන අවුරුද්ද | 2 වන අවුරුද්ද | 3 වන අවුරුද්ද | 4 වන අවුරුද්ද | 5 වන අවුරුද්ද |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| **ඒ—පන්තියේ කම්කරුවෙකුට** | | | | | | | | | | | | |
| ප්‍රොසෙස් ආර්ටිස්ට්වරු, ප්‍රොසෙස් කැමරා ඔපරේටර්වරු, ප්‍රොසෙස් එචර්වරු, ප්‍රොසෙස් හැන්ඩ්ස්, ලිතෝ ආර්ටිස්ට්වරු, ලිතෝ සහ ඕෆ්සෙට් මැෂින් මයින්ඩර්වරු, රොටරි මැෂින් මයින්ඩර්වරු, ෆොටෝග්‍රැව් සහ රෝටෝග්‍රැව් මැෂින් මයින්ඩර්වරු, ටින්ප්ලේට් ප්‍රින්ටර්වරු, ෆිල්ම් සෙටර්වරු, ලයිනෝටයිප් ඔපරේටර්වරු, මොනෝටයිප් කීබෝඩ් ඔපරේටර්වරු, ලඩ්ලෝ ඔපරේටර්වරු, ලයිනෝටයිප් මිකැනික්වරු, මුද්‍රණයන්ත්‍ර මිකැනික්වරු, ප්‍රොසෙස් එන්ග්‍රේවර්වරු සහ මවුන්ටර්වරු, ප්‍රොසෙස් ප්‍රින්ටර් ඩවුන්වරු, ලිතෝ ට්‍රාන්ස්ෆර්වරු, ලිතෝ පෑෂර්වරු, ශෝධ්‍යපත්‍ර කියවන්නෝ (පුවත්පත් නිෂ්පාදනයේ නියුක්තවූවන් හැර) ... ... ... ... ... | 121 18 ... | 39 0 ... | 51 0 ... | 64 0 ... | 80 0 ... | 98 0 ... | 96 42 ... | 42 12 ... | 50 02 ... | 57 92 ... | 69 52 ... | 81 62 |
| **බී—පන්තියේ කම්කරුවෙකුට** | | | | | | | | | | | | |
| මොනෝටයිප් කාස්ටර් යන්ත්‍ර ක්‍රියාකරවන්නන් (ඇටෙන්ඩන්ට්වරු), සුපර් කාස්ටර් යන්ත්‍ර ක්‍රියාකරවන්නන්, එල්රොඩ් මැෂින් ඔපරේටර්වරු, වර්ණයෝජකයෝ, ස්ටෝන් හැන්ඩ්වරු සහ ඉම්පෝසිං හැන්ඩ්වරු, ප්‍රෙස්මන්වරු, ලෙටර්ප්‍රෙස් සිලින්ඩර් මැෂින් මයින්ඩර්වරු සහ පෝෂකවරු, සිල්ක් ස්ක්‍රීන් මැෂින් ඔපරේටර්වරු, රබර් මුද්‍රා සාදන්නෝ, රිලීෆ් ස්ටැම්පර්වරු සහ ඩයි ස්ටැම්පිං මැෂින් ඔපරේටර්වරු, බයින්ඩර්වරු, බයින්ඩිං මැෂින් ඔපරේටර්වරු, මහන යන්ත්‍ර ඔපරේටර්වරු, නවන යන්ත්‍ර ඔපරේටර්වරු, කාටන් කැපීමේ සහ ඇලවීමේ මැෂින් ඔපරේටර්වරු, කපන්නෝ (අතින් සහ යන්ත්‍රයෙන්), ගිලටින් මැෂින් ඔපරේටර්වරු, ගිල්ඩින් මැෂින් ඔපරේටර්වරු, සහ ගිල්ඩර්වරු, රූල් ගසන්නෝ (අතින් සහ යන්ත්‍රයෙන්), ස්ටීරියෝ ටයිපර්වරු, මැන්ගල්මන්වරු, ෆවුන්ඩ්රිමන්වරු, ෆවුන්ඩ්රි තහඩු වත්කරන්නෝ, අකුරු වක්කරන්නෝ, ප්ලැටින් මැෂින් මයින්ඩර්වරු (සම්පූර්ණ ස්වයං ක්‍රියාකාරී යන්ත්‍ර ක්‍රියාකරුවන්), රෝලර් වත් කරන්නෝ (රෝල් වත්කිරීමේ තුවක්කුව පාවිච්චි කිරීමෙන් (හැන්ඩ් ෆෙඩ්) ප්ලැටින් මැෂින් මයින්ඩර්වරු, රෝලර් වත්කරන්නෝ (අතින්) ... | 109 99 ... | 32 0 ... | 43 0 ... | 57 0 ... | 73 0 ... | — ... | 77 92 ... | 36 57 ... | 48 17 ... | 54 22 ... | 62 96 ... | — |
| **සී—පන්තියේ කම්කරුවෙකුට** | | | | | | | | | | | | |
| ෆවුන්ඩ්රි ජ්-ලේට් විපර්වරු, ෆවුන්ඩ්රි කම්කරුවෝ, රොටරි කම්කරුවෝ, අසුරන්නෝ, ගණන් කරන්නෝ සහ හරිවැරදි බලන්නෝ ... ... | 84 63 ... | 30 0 ... | 36 0 ... | 44 0 ... | 53 0 ... | — ... | 68 67 ... | 38 42 ... | 43 51 ... | 48 67 ... | 56 15 ... | — |
| **ඩී—පන්තියේ කම්කරුවෙකුට** | | | | | | | | | | | | |
| අවුරුදු 18 ට නොඅඩු නුපුහුණු වැඩකරුවන් ... ... ... | 57 05 ... | 25 0 ... | 30 0 ... | 36 0 ... | 43 0 ... | — ... | 57 15 ... | — ... | — ... | — ... | — ... | — |
| **ඊ—පන්තියේ කම්කරුවෙකුට** | | | | | | | | | | | | |
| අවුරුදු 18 ට අඩු නුපුහුණු වැඩකරුවන් ... ... ... | 37 28 ... | — ... | — ... | — ... | — ... | — ... | 39 07 ... | — ... | — ... | — ... | — ... | — |
| **එෆ්—පන්තියේ වැඩකරුවෙකුට** | | | | | | | | | | | | |
| මුරකරුවන් ... ... ... ... | 58 04 ... | — ... | — ... | — ... | — ... | — ... | 59 42 ... | — ... | — ... | — ... | — ... | — |

3

මාසයකට ගෙවිය යුතු විශේෂ දීමනාවේ ප්‍රමාණය

(අ) ගතවූ මාසයේ ජීවන වියදම් අංකය 100·0 නම් විශේෂ දීමනාව වන්නේ

(ආ) ගතවූ මාසයේ ජීවන වියදම් අංකය 100·10 වැඩි වූ විට හෝ 100·00 අඩු වූ විට එය 100.10 ඉහළ ගෙනයන හෝ 100.00 පහළ ගෙනයන හෝ සෑම අංක 1·8 ට සම්පූර්ණ ඒකකයකට (ඒකකයේ ඛණ්ඩ ගණන් ගනු නොලැබේ) පහත දක්වෙන ප්‍රමාණයන් අනුව පිළිවෙලින් මෙහි පහත I වන හා II වන වක්‍රයන්හි නිර්දේශිත පරිද්දෙන් ගණන් බලා එන මුදලකින්, උචිත පරිද්දෙන් මීට ප්‍රථම 3 (අ) තීරයේ නියමිත විශේෂ දීමනාවේ ප්‍රමාණය වැඩි කළයුතු හෝ 3 (ආ) තීරයේ නියමිත විශේෂ දීමනාවේ ප්‍රමාණය අඩුකළ යුතු හෝ වන්නේය

| | (අ) වැඩ ඉගෙන ගන්නන් හා වැඩ පුරුදු වන්නන් නොවූ කම්කරුවන්ට | (අ) වැඩ ඉගෙන ගන්නෝ සහ වැඩ පුහුණු වන්නෝ: 1 වන අවුරුද්ද | 2 වන අවුරුද්ද | 3 වන අවුරුද්ද | 4 වන අවුරුද්ද | 5 වන අවුරුද්ද | (ආ) වැඩ ඉගෙන ගන්නන් හා වැඩ පුරුදු වන්නන් නොවූ කම්කරුවන්ට | (ආ) වැඩ ඉගෙන ගන්නෝ සහ වැඩ පුහුණු වන්නෝ: 1 වන අවුරුද්ද | 2 වන අවුරුද්ද | 3 වන අවුරුද්ද | 4 වන අවුරුද්ද | 5 වන අවුරුද්ද |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| **ඒ—පන්තියේ කම්කරුවෙකුට** | | | | | | | | | | | | |
| ප්‍රොසෙස් ආටිස්ට්වරු, ප්‍රොසෙස් කැමරා ඔපරේටර්වරු, ප්‍රොසෙස් එචර්වරු, ප්‍රොසෙස් හැන්ඩ්ස්, ලිතෝ ආටිස්ට්වරු, ලිතෝ සහ ඕෆ්සෙට් මැෂින් මයින්ඩර්වරු, රොටරි මැෂින් මයින්ඩර්වරු, ෆෝටෝග්‍රෙව් සහ රෝටාග්‍රෙව් මැෂින් මයින්ඩර්වරු, ටින්ප්ලේට් ප්‍රින්ටර්වරු, ෆිල්ම් සෙටර්වරු, ලියිනෝටයිප් ඔපරේටර්වරු, මොනෝටයිප් කීබෝඩ් ඔපරේටර්වරු, ලඩ්ලෝ ඔපරේටර්වරු, ලයිනෝටයිප් මිකැනික්වරු, මුද්‍රණයන්ත්‍ර මිකැනික්වරු, ප්‍රොසෙස් එන්ග්‍රෙවර්වරු සහ මවුන්ටර්වරු, ප්‍රොසෙස් ප්‍රින්ටර් ඩවුන්වරු, ලිතෝ ට්‍රාන්ස්පර්වරු, ලිතෝ පෘෘවර්වරු, ශෝධ්‍යපත්‍ර කියවන්නෝ (පුවත්පත් නිෂ්පාදනයේ නියුක්තවූවන් හැර) ... ... ... ... ... | 94 42 | 41 52 | 49 22 | 56 92 | 68 22 | 80 02 | 2 0 | 0 60 | 0 80 | 1 0 | 1 30 | 1 60 |
| **බී—පන්තියේ කම්කරුවෙකුට** | | | | | | | | | | | | |
| මොනෝටයිප් කාස්ටර් යන්ත්‍ර ක්‍රියාකරවන්නන් (ඇටෙන්ඩන්ට්වරු), සුපර් කාස්ටර් යන්ත්‍ර ක්‍රියාකරවන්නන්, එල්රොඩ් මැෂින් ඔප්රේටර්වරු, වර්ණයෝජකයෝ, ස්ටෝන් හැන්ඩ්වරු සහ ඉම්පෝසිං හැන්ඩ්වරු, ප්‍රෙස්මන්වරු, ලෙටර්ප්‍රෙස් සිලින්ඩර් මැෂින් මයින්ඩර්වරු සහ පෝෂකවරු, සිල්ක් ස්ක්‍රීන් මැෂින් ඔපරේටර්වරු, රබර් මුද්‍රා සාදන්නෝ, රිලීෆ් ස්ටැම්පර්වරු සහ ඩයි ස්ටැම්පිං මැෂින් ඔපරේටර්වරු, බයින්ඩර්වරු, බයින්ඩිං මැෂින් ඔපරේටර්වරු, මහන යන්ත්‍ර ඔපරේටර්වරු, නවන යන්ත්‍ර ඔපරේටර්වරු, කාටන් කැපීමේ සහ ඇලවීමේ මැෂින් ඔපරේටර්වරු, කපන්නෝ (අතින් සහ යන්ත්‍රයෙන්), ගිලටින් මැෂින් ඔපරේටර්වරු, ගිල්ඩින් මැෂින් ඔපරේටර්වරු, සහ ගිල්ඩර්වරු, රූල් ගසන්නෝ (අතින් සහ යන්ත්‍රයෙන්), ස්ටීරියෝ ටයිපර්වරු, මැන්ගල්මන්වරු, ෆවුන්ඩ්‍රිමන්වරු, ෆවුන්ඩ්‍රි තහඩු වක්කරන්නෝ, අකුරු වක්කරන්නෝ, ප්ලැටින් මැෂින් මයින්ඩර්වරු (සම්පූර්ණ ස්වයං ක්‍රියාකාරි යන්ත්‍ර ක්‍රියාකරුවන්), රෝලර් වත්කරන්නෝ (රෝල් වත්කිරීමේ තුවක්කුව පාවිච්චි කිරීමෙන් හැන්ඩ් ෆෙඩ්), ප්ලැටින් මැෂින් මයින්ඩර්වරු, රෝලර් වත්කරන්නෝ (අතින්) | 76 42 | 36 12 | 47 42 | 53 32 | 61 84 | — | 1 50 | 0 45 | 0 75 | 0 90 | 1 12 | — |
| **සී—පන්තියේ කම්කරුවෙකුට** | | | | | | | | | | | | |
| ෆවුන්ඩ්‍රි ප්ලේට් විපර්වරු, ෆවුන්ඩ්‍රි කම්කරුවෝ, රොටරි කම්කරුවෝ, අසුරන්නෝ, ගණන් කරන්නෝ සහ හරිවැරදි බලන්නෝ ... ... | 67 42 | 37 92 | 42 84 | 47 92 | 55 21 | — | 1 25 | 0 50 | 0 62 | 0 75 | 0 94 | — |
| **ඩී—පන්තියේ කම්කරුවෙකුට** | | | | | | | | | | | | |
| අවුරුදු 18ට නො අඩු නුපුහුණු වැඩකරුවන් ... ... ... | 56 21 | — | — | — | — | — | 0 94 | — | — | — | — | — |
| **ඊ—පන්තියේ කම්කරුවෙකුට** | | | | | | | | | | | | |
| අවුරුදු 18 ට අඩු නුපුහුණු වැඩකරුවන් ... ... ... | 38 62 | — | — | — | — | — | 0 45 | — | — | — | — | — |
| **එෆ්—පන්තියේ වැඩකරුවෙකුට** | | | | | | | | | | | | |
| මුරකරුවන් ... ... ... ... | 58 42 | — | — | — | — | — | 1 0 | — | — | — | — | — |

ඉහත 3 වන තීරයේ දක්වූ සංවිධාන භාවිතාකරන අන්දම දක්වන ගණන්වක්‍ර

| | I වන ගණන් වක්‍රය — ජීවන වියදම් අංකය ඉහළ නැංගවිට විශෙෂ දීමනාව ජීවන වියදම් අංක | | | | | II වන ගණන් වක්‍රය — ජීවන වියදම් අංකය පහළ බැස්ස විට විශේෂ දීමනාව—ජීවන වියදම් අංක | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 100·1 සිට 101.8 දක්වා රු. ශ. | 101·9 සිට 103.6 දක්වා රු. ශ. | 103·7 සිට 105.4 දක්වා රු. ශ. | 105·5 සිට 107.2 දක්වා රු. ශ. | 107·3 සිට 109.0 දක්වා රු. ශ. | 100·0 සිට 98.3 දක්වා රු. ශ. | 98·2 සිට 96.5 දක්වා රු. ශ. | 96·4 සිට 94.7 දක්වා රු. ශ. | 94 6 සිට 92.9 දක්වා රු. ශ. | 92·8 සිට 91.1 දක්වා රු. ශ. |
| **A පන්තිය :** | | | | | | | | | | |
| වැඩ ඉගෙන ගන්නන් හෝ වැඩ පුරුදු වන්නන් නොවූ කම්කරුවන්ට | 96 42 | 98 42 | 100 42 | 102 42 | 104 42 | 94 42 | 92 42 | 90 42 | 88 42 | 86 42 |
| වැඩ ඉගෙන ගන්නන් හෝ වැඩ පුරුදු වන්නන්ට— | | | | | | | | | | |
| 1 වන අවුරුද්ද | 42 12 | 42 72 | 43 32 | 43 92 | 44 52 | 41 52 | 40 92 | 40 32 | 39 72 | 39 12 |
| 2 වන අවුරුද්ද | 50 02 | 50 82 | 51 62 | 52 42 | 53 22 | 49 22 | 18 42 | 47 62 | 46 82 | 46 02 |
| 3 වන අවුරුද්ද | 57 92 | 53 92 | 59 92 | 60 92 | 61 92 | 56 92 | 55 92 | 54 92 | 53 92 | 52 92 |
| 4 වන අවුරුද්ද | 69 52 | 70 82 | 72 12 | 73 42 | 74 72 | 68 22 | 66 92 | 65 62 | 64 32 | 63 02 |
| 5 වන අවුරුද්ද | 81 62 | 83 22 | 84 82 | 86 42 | 88 02 | 80 02 | 78 42 | 76 82 | 75 22 | 73 62 |
| **B පන්තිය:** | | | | | | | | | | |
| වැඩ ඉගෙන ගන්නන් හෝ වැඩ පුරුදු වන්නන් නොවූ කම්කරුවන්ට | 77 92 | 79 42 | 80 92 | 82 42 | 83 92 | 76 42 | 74 92 | 73 42 | 71 92 | 70 42 |
| වැඩ ඉගෙන ගන්නන් හෝ වැඩ පුරුදු වන්නන්ට— | | | | | | | | | | |
| 1 වන අවුරුද්ද | 36 57 | 37 02 | 37 47 | 37 92 | 38 37 | 36 12 | 35 67 | 35 22 | 34 77 | 34 32 |
| 2 වන අවුරුද්ද | 48 17 | 48 92 | 49 67 | 50 42 | 51 17 | 47 42 | 46 67 | 45 92 | 45 17 | 44 42 |
| 3 වන අවුරුද්ද | 54 22 | 55 12 | 56 02 | 56 92 | 57 82 | 53 32 | 52 42 | 51 52 | 50 62 | 49 72 |
| 4 වන අවුරුද්ද | 62 96 | 64 08 | 65 20 | 66 32 | 67 44 | 61 84 | 60 72 | 59 60 | 58 48 | 57 36 |
| **C පන්තිය :** | | | | | | | | | | |
| වැඩ ඉගෙන ගන්නන් හෝ වැඩ පුරුදු වන්නන් නොවූ කම්කරුවන්ට | 68 67 | 69 92 | 71 17 | 72 42 | 73 67 | 67 42 | 66 17 | 64 92 | 63 67 | 62 42 |
| වැඩ ඉගෙන ගන්නන් හෝ වැඩ පුරුදුවන්නන්ට— | | | | | | | | | | |
| 1 වන අවුරුද්ද | 38 42 | 38 92 | 39 42 | 39 92 | 40 42 | 37 92 | 37 42 | 36 92 | 33 42 | 35 92 |
| 2 වන අවුරුද්ද | 43 46 | 44 08 | 44 70 | 45 32 | 45 94 | 42 84 | 42 22 | 41 60 | 40 98 | 40 36 |
